WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

NEW | 87 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II
Communication and Media Studies I, II

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවන** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

**1.** රුවන්, මහේෂ් සහ කමලා එකතු ව සකස් කළ පිටු විස්සකින් යුත් මාධ්‍ය ව්‍යාපෘති වාර්තාව මුද්‍රණය කර ගැනීම සඳහා ඔවිහු නගරයේ පිහිටි නවීන පහසුකම් සහිත සන්නිවේදන මධ්‍යස්ථානයක් වෙත යාමට එකඟ වූහ.

(i) ඉහත එකඟතාවයට පදනම් වූ සන්නිවේදන වර්ගය කුමක් ද?

(ii) ව්‍යාපෘති වාර්තාවට අදාළ දත්ත එක්රැස් කිරීමේ දී යොදා ගැනීමට ඉඩ ඇතැයි විශ්වාස කළ හැකි ක්‍රම **දෙකක්** දක්වන්න.

(iii) පරිගණක මුද්‍රණයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(iv) පරිගණක අකුරු ඇමුණුම සිදු කළ වහා ම විදෙස් රටක සිටින තම සොයුරාට එහි මෘදු පිටපතක් යැවීමට මහේෂ් පොරොන්දු වී තිබුණි. ඊට වඩාත් ම සුදුසු විධි ක්‍රමය කුමක් ද?

(v) මුද්‍රණය කරන ලද වාර්තාවේ දෘඪ පිටපතක් තම පෞද්ගලික පරිහරණය සඳහා තබා ගැනීමට රුවන් බලාපොරොත්තු වේ. මේ සඳහා වඩාත් ම සුදුසු ක්‍රමය කුමක් ද?

(vi) මුද්‍රිත වාර්තාවේ මුල් පිටුවෙහි ආරක්ෂාව සඳහා ප්ලාස්ටික් ආවරණයක් යෙදීම සුදුසු බව කමලා ප්‍රකාශ කළා ය. මෙම විධි ක්‍රමය කෙසේ හඳුන්වන්නේ ද?

(vii) ඉහත කී වාර්තාව පොතක් ලෙස බැඳීමේ දී යොදා ගත හැකි බැඳුම් ක්‍රම **දෙකක්** දක්වන්න.

(viii) යුනෙස්කෝ අර්ථකථනයට අනුව පොතක තිබිය යුතු අවම පිටු ප්‍රමාණය කොපමණ ද?

(ix) පොත් සහ සඟරා හැරුණු විට දක්නට ලැබෙන මුද්‍රිත මාධ්‍ය ස්වරූප **දෙකක්** නම් කරන්න.

(x) මුද්‍රිත මාධ්‍ය බොහොමයක ඡායාරූප භාවිතය නිතර දක්නට ලැබේ. ඡායාරූප හැරුණු විට ඒවායේ භාවිත කෙරෙන රූපාශ්‍රිත ප්‍රකාශන විධි **දෙකක්** සඳහන් කරන්න.

**2.** (i) "ලංකාවේ ප්‍රකාශයට පත් පළමු පුවත්පත ලක්මිණි පහනයි" ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතුව දක්වන්න.

(ii) "බුද්ධිමය දේපළ පනත තුළ 'කෘතිය' යනුවෙන් හඳුන්වන්නේ පොත්, ලිපි හා පත්‍රිකා ය." ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතුව දක්වන්න.

(iii) " 'අර්ථ බාධක' යනු සංදේශය නිසි ලෙස ග්‍රාහකයා වෙත සම්ප්‍රේෂණය නොවීම නිසා ඇති වන තත්ත්වයකි." ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු **තුනක්** දක්වන්න.

(iv) "මුද්‍රිත මාධ්‍යයට ඡායාරූප එක්වීම වාසිදායක වූවකි." ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු **හතරක්** දක්වන්න.

**3.** (i) ශ්‍රී ලංකාවේ දැනට බහුල ලෙස භාවිත වන ගුවන් විදුලි තරංග වර්ගය කුමක් ද?

(ii) පුවත්පත්-සඟරා, රූපවාහිනී-සිනමා යන ජනමාධ්‍යවල ග්‍රාහකයා හඳුන්වන විශේෂිත නාම **දෙක** පිළිවෙළින් දක්වන්න.

(iii) රූපවාහිනී මාධ්‍ය වැඩසටහන් ප්‍රභේද **තුනක්** කෙටියෙන් හඳුන්වන්න.

(iv) මාධ්‍ය වාර්තාකරණයේ දී භාවිත කළ හැකි මූලාශ්‍රය **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.

[ශයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**4.** ලංකා ජාතික පාසලේ සියවන සංවත්සරය අධ්‍යාපන ඇමතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

(i) පාසලේ ඉතිහාසය දැක්වෙන චිත්‍රපටයක් නිර්මාණය කර තිබේ. එවැනි චිත්‍රපට හඳුන්වන නාමය කුමක් ද?

(ii) උත්සවයේ දී එය ප්‍රදර්ශනය කිරීමට භාවිත කළ යුතු මාධ්‍ය උපකරණ **දෙකක්** නම් කරන්න.

(iii) විදුහලට නව විද්‍යුත් තැපැල් ලිපිනයක් නිර්මාණය කෙරිණි. විද්‍යුත් තැපෑලෙහි ඇති ප්‍රයෝජන **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) උත්සවය පිළිබඳ ප්‍රධාන කරුණු **හතරක්** ඇතුළත් ප්‍රවෘත්තියක මුලපාඨය රචනා කර, අදාළ කරුණු යටින් පැහැදිලිව ඉරි ඇඳ පෙන්වන්න.

**5.** (i) ශ්‍රී ලංකාව තුළ පුවත්පත් පිළිබඳ පිළිගත් ආචාරධර්ම පද්ධති කිහිපයක් ම ක්‍රියාත්මක වේ. ඒවා අතුරින් එක් ආචාරධර්ම පද්ධතියක් නම් කරන්න.

(ii) මුද්‍රිත මාධ්‍ය ක්ෂේත්‍රයේ අත් පත්‍රිකා යනු විශේෂිත සන්නිවේදන ක්‍රමයකි. අත් පත්‍රිකා භාවිතය වඩාත් උචිත වන අවස්ථා **දෙකක්** දක්වන්න.

(iii) පුවත්පත් සඳහා ප්‍රවෘත්ති වාර්තා කිරීමේ දී 'යටිකුරු පිරමිඩ' ක්‍රමය බොහෝවිට භාවිත කෙරේ. එකී වාර්තාකරණයේ වාසි **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ගුවන්විදුලිය ප්‍රබල ජනමාධ්‍යයකි. එහෙත් ඊට ආවේණික දුබලතා බොහෝ ය. එවැනි දුබලතා **හතරක්** විස්තර කරන්න.

**6.** අන්තර් පාඨශාලීය ක්‍රිකට් තරගයෙන් ජයගත් රවීගේ ක්‍රිකට්ත්වය පිළිබඳ බොහෝ දෙනා ප්‍රසාදයෙන් කථා කරනු ඇසිණි.

(i) ක්‍රීඩකයෙකු හාත්පස සිටින ශ්‍රාවකයන් දෙස නිරතුරුව බලමින් කථාව පවත්වාගෙන යයි. මෙම උපක්‍රමය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

(ii) තරගයේදී රවීට උදව් වී යැයි සිතිය හැකි නිර්වාචික ලක්ෂණ **හතරක්** නම් කරන්න.

(iii) රවීගේ ජයග්‍රහණය පිළිබඳ පුවත්පත්වල තොරතුරු පළවී තිබුණි. ඒ සඳහා යොදා ගෙන තිබූ පුවත්පත් අන්තර්ගතයට අයත් අංග **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ක්‍රිකට් තරගයකට සූදානම් වීමේ දී රවී වැඩි වශයෙන් තොරතුරු ලබා ගත්තේ නව මාධ්‍ය ඇසුරිනි. නව මාධ්‍යයේ ස්වභාවය කරුණු **හතරක්** ඇසුරින් පැහැදිලි කරන්න.

**7.** සන්නිවේදකයා → පණිවිඩය → මාධ්‍ය → ග්‍රාහකයා → X

(i) ඉහත රූප සටහන හැරල්ඩ් ලැස්වෙල්ගේ සන්නිවේදන නිර්වචනය ඇසුරින් සකසා ඇත්නම්, එහි අවසාන අංගය වන X නම් කරන්න.

(ii) X නැමැති අංගය සමඟ සන්නිවේදන අරමුණු සමීප සබඳතාවක් දක්වයි. ප්‍රධාන සන්නිවේදන අරමුණු **හතර** කවරේ ද?

(iii) පාසල් පංති කාමරය තුළ දී සිදුවන්නේ ද සන්නිවේදන ක්‍රියාවලියකි. එහි දී උපයෝගී කර ගත හැකි ප්‍රක්ෂේපණීය නො වන පන්ති කාමර මාධ්‍ය උපකරණ **තුනක්** භාවිත කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ඉහත රූප සටහනට අදාළ සන්නිවේදන ක්‍රියාවලිය ජනමාධ්‍ය තුළ දී ද සිදු වේ. ජනමාධ්‍ය සතු විශේෂ ලක්ෂණ **හතරක්** විස්තර කරන්න.

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...